ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය



වාර්ෂික වාර්තාව
2020

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
සංචාරක අමාත්‍යාංශය

අන්තර්ගතය

1. හැඳින්වීම

2. ආයතනික තොරතුරු

2.1 SLITHM අධ්‍යක්ෂ මණ්ඩලය 5

2.2 SLITHM විගණන හා කළමනාකරණ කමිටුව 6

2.3 SLITHM ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 6

3. ආයතනික ධූරාවලිය 7

4. SLITHM කාර්ය සාධනයේ කැපී පෙනෙන අවස්ථා 8

5. පළාත් පාසල් වල කාර්ය සාධනය 10

5.1 අනුරාධපුර පළාත් පාසල 10

5.2 බණ්ඩාරවෙල පළාත් පාසල 12

5.3 කොළඹ පළාත් පාසල 14

5.4 මහනුවර පළාත් පාසල 18

5.5 කොග්ගල පළාත් පාසල 20

5.6 රත්නපුර පළාත් පාසල 22

5.7 කුරුණෑගල පළාත් පාසල 25

5.8 පාසිකුඩා පළාත් පාසල 27

5.9 යාපනය පළාත් පාසල 29

6. ප්‍රධාන කාර්යාලයේ අංශවල කාර්ය සාධනය 30

6.1 ලේඛකාධිකාරි කාර්යාලය 30

6.2 මානව සම්පත් සහ පරිපාලන අංශය 32

6.3 මුදල් අංශය 32

6.4 අලෙවි සහ මහජන සම්බන්ධතා අංශය 33

6.5 තොරතුරු තාක්ෂණ (IT) අංශය 34

6.6 පුස්තකාලය 34

6.7 අභ්‍යන්තර විගණන අංශය 35

6.8 සමුද්‍රා පුහුණු හෝටලය 35

6.9 ලොන්ඩ්‍රි අංශය 36

7. මූල්‍ය ප්‍රකාශන 37 - 57

8. විගණකාධිපති වාර්තාව 58 - 65

1. හැඳින්වීම

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) යනු සංචාරක හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් පුහුණු කිරීම හා දැනුම ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ දශක 5 කට වැඩි කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයකි. SLITHM සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එහි ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇත. දිවයින පුරා සිසුන්ට පහසුකම් සැලසීම සඳහා අනුරාධපුර, බණ්ඩාරවෙල, මහනුවර, කොග්ගල, රත්නපුර, කුරුණෑගල, පාසිකුඩා සහ යාපනය යන ප්‍රදේශවල පළාත් පාසල් පිහිටුවා තිබේ.

2019 වර්ෂයේ අග භාගයේ සිට COVID - 19 වසංගතය පැතිරීමත් සමග සෞඛ්‍ය, සමාජීය හා ආර්ථික අංශ ඇතුළු විවිධ අංශ සම්බන්ධයෙන් මුළු ලෝකයම පෙර නොවූ විරූ අත්දැකීම් වලට මුහුණ දෙන ලදි. සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තය COVID - 19 වසංගතය පැන නැගීම හමුවේ දැඩි ලෙස බලපෑමට ලක්වී ඇති ප්‍රධාන කර්මාන්තවලින් එකකි. 2019 අප්‍රේල් මාසයේ සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් පසු සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තය යථා තත්ත්වයට පත්වූ නමුත් COVID - 19 වසංගතය හේතුවෙන් යළිත් පසුබැමට ලක් වූ අතර පසුගිය වසර දෙක හා සසඳන විට එය 95% ක පමණ අඩුවීමකි. පොදුවේ ගත් කල, ශ්‍රී ලංකා ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ, රෙදිපිළි හා ඇඟලුම් අතර සංචාරක ව්‍යාපාරය රටට තුන්වන විශාලතම විදේශ ඉපැයුම් මාර්ගය උපයන්නා විය.

2020 දී ශ්‍රී ලංකාවට පැමිණි මුළු ජාත්‍යන්තර සංචාරකයින්ගේ සංඛ්‍යාව 507,704 කි. ශ්‍රී ලංකාවට පැමිණෙන සියලුම මගී ගුවන් ගමන් සහ නැව් නතර කිරීම හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීම අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අවම මට්ටමක පැවතිනි. 2019 වසරේදී 1,913,702 ක් වූ සංචාරකයින්ගේ පැමිණීම සමග සංසන්දනය කරන කල එය 2020 වසරේදී 73.5% ක විශාල පහත වැටීමකි. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව විදේශීය හා දේශීය සංචාරක කර්මාන්තය දියුණු කිරීමටත් සංචාරක ආයතනවල රැකියා සඳහා මනා පුහුණුව ලත් මිනිස්බල ඉල්ලුම වැඩි කිරීමටත් අපේක්ෂා කරන ලදී.

SLITHM හි ප්‍රධාන පරමාර්ථය වනුයේ, කර්මාන්තයේ ඉහළ හා මධ්‍යම කළමනාකරණ තනතුරු සඳහා පිරිස් පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ශිල්පීය මට්ටමේ සිට කළමනාකරණ මට්ටමේ ඩිප්ලෝමා දක්වා කෙටිකාලීන හා දිගු කාලීන පාඨමාලා ප්‍රදානය කරමින් සංචාරක හා ආගන්තුක සත්කාර වෙළඳාමේ විවිධ දෙපාර්තමේන්තු සඳහා පුහුණුව ලත් මිනිස්බල අවශ්‍යතාවය සපුරාලීමයි.

තවද, ශ්‍රී ලංකාවේ සහ ආසියාවේ වෙනස්වන කර්මාන්තයේ විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා SLITHM සිය වැඩසටහන් මනාව සකස් කොට ඇත. පුළුල් වෙළඳපල අවශ්‍යතා මත පදනම්ව, සංචාරක කර්මාන්තයට විශේෂිත වූ ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවයන් ලබා ගැනීමේ අවස්ථා සමග නව පුහුණු ක්‍රම කිහිපයක් නිතර හඳුන්වා දෙනු ලැබේ. පුහුණුව තෝරා ගැනීමේදී සිසුන්ට වඩාත් නම්‍යශීලී වීමට මෙම යෝජනා ක්‍රමය ඉඩ සලසන අතර පාඨමාලාවට ඇතුළත්වීමේ සහ පිටවීමේ විවිධ අවස්ථා සලසයි. පූර්ව ඉගෙනීම ද පිළිගැනීමට ලක්කරන අතර එමඟින් කර්මාන්තයේ අත්දැකීම් ලබා ඇති අයට සහ හොඳ වෘත්තීය සුදුසුකමක් තුළින් වැඩිදුර දැනුම ලබා ගන්නා අයට ප්‍රතිලාභ ලැබේ.

අපේ දැක්ම

"ආසියාවේ සංචාරක හා ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව හා අධ්‍යාපනය සපයන විශිෂ්ඨතම මධ්‍යස්ථානය බවට පත් වීම."

අපේ මෙහෙවර

ආගන්තුක සත්කාරක සහ සංචාරක කර්මාන්තවල ඉල්ලීම් සපුරාලීම සඳහා, නිපුණ හා කැපවූ මානව සම්පත් බිහි කිරීම සඳහා ඉල්ලුම පදනම් කරගත් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දීම.

අපේ තේමාව

"ශ්‍රී ලංකාව ගෝලීය අග්‍රස්ථානය වෙත රැගෙන යාම - ශ්‍රී ලාංකීය ආගන්තුක සත්කාරක සේවය ලෝකය තුළ විශිෂ්ඨත්වය කරා ගමන් කරවීම."

අපගේ වටිනාකම්

ගුණාත්මකභාවය

අපගේ සිසුන්ට උසස් වටිනාකමක් ලබා දෙන පළමු පන්තියේ හා අධ්‍යාපන වැඩසටහන් අපි ලබා දෙන්නෙමු.

සාධාරණත්වය

ඉහලම ජයග්‍රහණයක් හා වර්ධනයක් සඳහා, සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ මානව සම්පත් පිළිබඳව ඇති ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිති අවශ්‍යතාවයන් සපුරාලීමට, සෑම ශ්‍රී ලාංකිකයකුටම සාධාරණ සහ එක සමාන අවස්ථා උදා කර දීමට අපි සහතික වන්නෙමු.

අඛණ්ඩතාවය

සංචාරක හා සත්කාරක සේවා සඳහා මානව සම්පත් පුහුණු අවශ්‍යතා සපුරාලීමට, වෘත්තීමය අචාර ධර්ම හා ශික්ෂාවන්නි ඉහළම ප්‍රමිතීන් අනුගමනය කිරීමට අපි දැඩි උත්සහයක් දරන්නෙමු.

අපගේ අරමුණු

- සංචාරක සහ ආගන්තුක සත්කාරක කර්මාන්තය සඳහා ඉහලම ගුණාත්මක වෘත්තිකයින් බිහි කිරීමට, සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ පුහුණු සහ අධ්‍යාපනික වැඩසටහන් හඳුනා ගැනීම, නිර්මාණය කිරීම හා ලබා දීම.
- සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්ත සඳහා ඉහළම තත්වයේ වෘත්තිකයන් බිහි කිරීම.
- සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තය තුළ නිරතුරුව වෙනස්වන හා අභියෝගාත්මක ප්‍රවණතා පිළිබඳව අවධානය යොමු කරමින්, සංචාරක හා සත්කාරක කර්මාන්තය තුල ඇති ඉල්ලුම සපුරාලීමට අවැසි ශ්‍රම බලකාය පුහුණු කිරීම.
- සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයේ තිරසාර වර්ධනයක් සහතික කරමින් රටේ විවිධ ප්‍රදේශ වල ජීවත් වන සියළුම තරුණ තරුණියන් හට සාධාරණව සේවය කල හැකි පරිසරයක් නිර්මාණය කිරීම සහ සැමට සම අවස්ථා ලබා දීම.
- දේශීය හා ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමග අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී ආකාරයකින් කටයුතු කිරීම තුළින් සංචාරක හා ආගන්තුක සත්කාරක අධ්‍යාපනය සැපයීමේ ශක්‍යතාවය පුළුල් කිරීම.
- සංචාරක හා ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ පර්යේෂණ හරහා අන්තර්ජාතික දැනුම හා සම්බන්ධතාවයට එකතු වන විශිෂ්ඨත්වය ප්‍රදර්ශනය කිරීම.

2. ආයතනික තොරතුරු

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) යනු 1964 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ජාතියේ පුරෝගාමී ආගන්තුක සත්කාර සහ සංචාරක අධ්‍යාපන සැපයුම්කරු සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර 2005 අංක 38 සංචාරක පනත මගින් නියාමනය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සංචාරක හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම වෘත්තීය අධ්‍යාපන ආයතනය වන්නේ SLITHM ය.

ලියාපදිංචි නාමය	: ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
නෛතික ව්‍යුහය	: 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය ව්‍යවසාය ආයතනයකි.
ප්‍රධාන කාර්යාලයේ ලිපිනය	: නො. 78, ගාලු පාර, කොළඹ - 03
විගණක	: ශ්‍රී ලංකා විගණකාධිපති
බැංකුකරු	: ලංකා බැංකුව

පළාත් පාසැල් අට පිහිටා තිබෙන ස්ථාන :

අනුරාධපුර පළාත් පාසල	: ධර්මසිරි සේනානායක සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී මහා බෝධි මාවත, අනුරාධපුර
බණ්ඩාරවෙල පළාත් පාසල	: ජාතික නිවාඩු නිකේතනය,ගොල්ෆ් ලින්ක් පාර, බණ්ඩාරවෙල
කොළඹ පළාත් පාසල	: නො. 78, ගාලු පාර, කොළඹ - 03
මහනුවර පළාත් පාසල	: මහවැලි උයන, කුණ්ඩසාලේ, මහනුවර
කොග්ගල පළාත් පාසල	: කොග්ගල නිදහස් වෙළඳ කලාපය, හබරාදූව, කොග්ගල
කුරුණෑගල පළාත් පාසල	: මගුරුඔයවත්ත, බෝයගනේ, කුරුණෑගල
පාසිකුඩා පළාත් පාසල	: ජාතික නිවාඩු නිකේතන කාර්යාලය, පාසිකුඩා
රත්නපුර පළාත් පාසල	: නව නගරය, රත්නපුර
යාපනය පළාත් පාසල	: රාජ්‍ය පරිපාලන තානායම, කයිට්ස් පාර, යාපනය

2.1 SLITHM අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිනිය	: කිමාලි ප්‍රනාන්දු මහත්මිය
<u>රාජ්‍ය අංශ නියෝජිතයන්</u>	
SLITHM අධ්‍යක්ෂ ජනරාල්	: එස්.එල්.එම්. හසීම් මහතා (වැඩබලන - 2019 මැයි සිට 2020 මාර්තු දක්වා)
	: ඩී.එල්. සන්නසූරිය මිය (වැඩබලන - 2020 මාර්තු සිට ඔක්තොම්බර් දක්වා)
	: නදීකා වටලියද්ද මිය (2020 ඔක්තෝම්බර් 21 දින සිට)
සංචාරක අමාත්‍යාංශය	: ඩී.එල්. සන්නසූරිය මිය
SLTDA අධ්‍යක්ෂ ජනරාල්	: ධම්මිකා විජයසිංහ මෙනෙවිය

<u>පෞද්ගලික අංශ නියෝජිතයන්</u>

1. ආචාර්ය දිනුෂාන් වන්නිආරච්චි මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
2. නිස්ස ගුණවර්ධන මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
3. බන්දුල ඒකනායක මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
4. බසීර් කාසිම් මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
5. සුරේෂ් මෙන්ඩිස් මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
6. නිෂාඩ් විජේතුංග මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
7. එක්සත් විජේරත්න මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
8. පී.ඒ.එම්.බී. ප්‍රියාල් පෙරේරා මහතා (2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)

නිරීක්ෂක

එම්.කේ.ඩී.එන්. මාදම්පේ මිය	: නිරීක්ෂක, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය
අරුණි පෙරේරා මිය	: ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩලය

2.2 SLITHM විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

සභාපතිනිය	: නිලූකා මාදම්පේ මිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රතිපත්ති රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
සාමාජිකයන්	: බන්දුල ඒකනායක මහතා, SLITHM හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ආචාර්ය දිනූෂාන් වන්නිආරච්චි මහතා, SLITHM හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සුනන්දා පියසීලි මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංචාරක අමාත්‍යාංශය
නිරීක්ෂක	: එස්. සංජීව මහතා - විගණකාධිපතිගේ නියෝජිත
කැඳවුම්කරු	: මලිත් ධනුසේකර මහතා, සහකාර අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණන

2.3 SLITHM ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

සභාපතිනිය	: කිමාලි ප්‍රනාන්දු මිය
අධ්‍යක්ෂ ජනරාල්	: එස්.එල්.එම්.හෂීම් මහතා (වැඩබලන - 2019 මැයි සිට 2020 මාර්තු දක්වා)
	: ඩී.එල්.සන්නසූරිය මිය (වැඩබලන - 2020 මාර්තු සිට 2020 ඔක්තොම්බර් දක්වා)
	: නදීකා වටලියද්ද මිය (2020 ඔක්තොම්බර් 21 දින සිට)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන)	: සන්තුසිත පනන්වල මහතා
	: කණිෂ්ක ජයතුංග මහතා (වැඩබලන)
අධ්‍යක්ෂ මුදල්	: රොයිස් ප්‍රනාන්දු මහතා
ලේඛකාධිකාරී	: වසන්ත මන්ත්‍රීපාල මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන	: අමිතා ඕවිට්පාන මහත්මිය
කළමනාකරු - සමුද්‍රා හෝටලය	: හර්ෂණ පොන්නම්පෙරුම මහතා
සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණය	: දිල්රුවන් රත්නායක මහතා
සහකාර අධ්‍යක්ෂ - අලෙවි	: සාගර කුලසිංහ මහතා
පුස්තකාලයාධිපති	: ගංගා වල්පොල මහත්මිය
සහකාර අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක	: මලිත් ධනුසේකර මහතා

SLITHM පළාත් පාසල්වල විදුහල්පතිවරු

අනුරාධපුර	: පී.එම්.සී. තෙන්නකෝන් මහතා
	: ලාල් සෙනෙවිරත්න මහතා
බණ්ඩාරවෙල	: චමින්ද තෙන්නකෝන් මහතා
කොළඹ	: සමන් හතුරුසිංහ මහතා
මහනුවර	: කුමුදුනී වික්‍රමසිංහ මහත්මිය
කොග්ගල	: ආර්.ඩී.ඒ. ලෙනාඩ් මහතා
කුරුණෑගල	: සරත් කුමාර මහතා
	: රියන්සි ජයවර්ධන මහතා
රත්නපුර	: කණිෂ්ක එන්. ජයතුංග මහතා
පාසිකුඩා	: රමේෂ් පෙරේරා මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ භාර නිළධාරී)
යාපනය	: නිරංජලා ෆ්‍රැන්සිස් මහත්මිය (සහකාර කථිකාචාර්ය සහ භාර නිළධාරිනී)

අංශ ප්‍රධානීන්

වෘත්තීය සුපවේදී අංශය	: නිශාන්ත කුලතුංග මහතා
ආහාර සහ පාන අංශය	: ඩික්සන් කුමාර මහතා
ඉදිරිපස කාර්යාල අංශය	: උදේන සිල්පතිලක මහතා
හෝටල් ගෘහ පාලන අංශය	: ලෙනාඩ් පෙරේරා මහතා
සංචරණය සහ සංචාරක අංශය	: සුජිත් යමසිංහ මහතා

3. ආයතනික ධූරාවලිය



	DG	DDG	Director	Principal	S/L AR 2	A/L AR 1	MM 1-2	JM (E/A)	JM 1-2	MA 2-2	MA 1-2	PL 3 (Skilled)	PL 2 (Semi-Skilled)	PL 1 (Unskilled)	Total
SLITHM	01	02	03	07	23	53	08	(05)	12	01	37	12	05	21	190
Samudra Hotel	-	-	-	-	-	-	01	-	02	-	03	02	10	09	27
Total	01	02	03	07	23	53	09	05	14	01	40	14	15	30	217

4. SLITHM කාර්ය සාධනයේ කැපී පෙනෙන අවස්ථා

වගුව 1 : 2016 සිට 2020 දක්වා කාලය තුල පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව.

පාසැල	2016	2017	2018	2019	2020
කොළඹ	839	843	815	1056	508
අනුරාධපුර	195	152	190	374	143
බණ්ඩාරවෙල	247	227	253	495	193
මහනුවර	466	470	562	641	228
කොග්ගල	701	707	651	909	501
කුරුණෑගල	382	259	454	538	304
රත්නපුර	401	349	327	465	198
පාසිකුඩා	99	84	51	74	37
යාපනය	-	-	12	23	36
මුළු ගණන	**2,476**	**3,091**	**3,315**	**4,575**	**2,148**



ඉහත තීරු ප්‍රස්ථාරය මගින් 2016 සිට 2020 දක්වා පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව නිරූපණය කෙරේ. රටේ COVID - 19 වසංගතය හේතුවෙන් පසුගිය සිව් වසර හා සසඳන විට 2020 වර්ෂයේ දී SLITHM හි පුහුණුව ලැබූ සිසුන් ප්‍රමාණය වැඩි කිරීමට නොහැකි විය.

පාඨමාලා	උප පාඨමාලා	2020 (පුරෝකථනය)	2020 (තත්‍ය)
වසර 4 කළමනාකරණ ඩිප්ලෝමාව (අතරමැදි සහ උසස් මට්ටම්)	ආහාර පාන මෙහෙයුම්	20	19
	වෘත්තීය සූපවේදය	20	13
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	20	9
	ගෘහපාලන මෙහෙයුම්	20	6
වසර 3 කළමනාකරණ ඩිප්ලෝමාව		85	66
සහතිකපත්‍ර මට්ටම	අවන්හල් හා බීමහල් සේවා	275	258
	වෘත්තීය සූපවේදය	280	286
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	275	224
	ගෘහපාලන මෙහෙයුම්	270	222
ශිල්පීය මට්ටම	අවන්හල් හා බීමහල් සේවා	285	254
	සූපවේදය	245	276
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	230	109
	ගෘහපාලන මෙහෙයුම්	285	206
13 වසර වැඩසටහන් සිසුන් සඳහා ශිල්පීය මට්ටම් ඩිප්ලෝමාව	අවන්හල් හා බීමහල් සේවා	220	රටේ පවතින තත්වය හේතුවෙන් මෙම වැඩසටහන ආරම්භ කිරීමට නොහැකි විය
	සූපවේදය	180	
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	195	
	හෝටල් ගෘහපාලන මෙහෙයුම්	215	
පේස්ට්‍රි සහ බේකරි (මාස 3)		75	73
ජාතික සංචාරක මාර්ගෝපදේශන පාඨමාලාව		80	77
ෂෝෆර් සංචාරක මාර්ගෝපදේශන පාඨමාලාව		80	50
එකතුව		**3,355**	**2,148**



5. පළාත් පාසල්වල කාර්ය සාධනය

5.1 අනුරාධපුර පළාත් පාසල



SLITHM අනුරාධපුර පළාත් පාසල, 1992 දී ජාතික නිවාඩු නිකේතනයේ ආරම්භ කරන ලදි. මෙම පාසල මඟින් මූලික මට්ටමේ - හෝටල් පිළිගැනීමේ සහ හෝටල් ගෘහ පාලනයේ පාඨමාලා පමණක් ප්‍රදානය කරන ලදි. 1996 සිට මූලික මට්ටමේ වෘත්තීය සූපවේදනය සහ ආපනශාලා සහ බීමහල් පාඨමාලා පිරිනමන ලදි. මෙම පාසල 2005 දී වර්තමාන ගොඩනැගිල්ලට ගෙන යන ලදි. මෙම පළාත් පාසල උතුරු මැද පළාතේ පිහිටුවා තිබුණද, එමඟින් කුරුණෑගල, පුත්තලම, හලාවත, කුලියාපිටිය වැනි අවට ප්‍රදේශවල ජනතාවට ද සේවය ලබා දී ඇත.

පවතින පහසුකම්

- දේශන ශාලා 04 (සෑම එකකම සිසුන් සංඛ්‍යාව 30)
- පුහුණු මුළුතැන්ගෙය 01
- පුහුණු ආපනශාලා 01
- මොක් අප් කාමර 01
- පරිගණක විද්‍යාගාර 01
- ලොකර් කාමර 01

අධ්‍යයන කාර්ය මණ්ඩලය

විදුහල්පති : ටී. එම්. සී. තෙන්නකෝන් මහතා
පී. ජේ. ද අල්විස් සෙනෙවිරත්න මහතා (වැඩබලන)

පාඨමාලාව	දේශක	තනතුර
වෘත්තීය සූපවේදය	එම්. එස්. මඩවල මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර පාන මෙහෙයුම්	ආර්. එම්. ඒ. පී. රත්නායක මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	පී. පී .එම්. ගමගේ මහතා	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	එම්. එන්. ප්‍රනාන්දු මහතා	සහකාර කථිකාචාර්ය

සටහන : මීට අමතරව බාහිර කථිකාචාර්යවරු 11ක් ද සිටින ලදි.

2019 සහ 2020 වසරවලදී පුහුණු කරන ලද සිසුන් සංඛ්‍යාව

වගුව 3. 2019 සහ 2020 වසර තුළදී අනුරාධපුර පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

ප්‍රධාන පාඨමාලාව	පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	86	27
	අවන්හල් සහ බීම හල් සේවා	54	19
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	12	-
	හෝටල් ගෘහ පාලනය	29	14
උප එකතුව - ශිල්පීය මට්ටම		**181**	**60**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	81	26
	අවන්හල් සහ බීම හල් සේවා	64	23
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	34	12
	හෝටල් ගෘහ පාලනය	14	22
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**193**	**83**
මුළු එකතුව		**374**	**143**



අනුරාධපුර පළාත් පාසලේ පාඨමාලා සඳහා පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව 2019 සහ 2020 දී පිළිවෙලින් 374 සිට 143 දක්වා අඩු වූ අතර එය පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාවෙන් සියයට 50 ක අඩුවීමකි.

2020 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධනය සහ වෙනත් වැඩසටහන්

- කෑම මේස සිරිත් හා ආචාර විධි පිළිබඳ මිහින්තලේ රජරට විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සිසුන් 80 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- කෑම මේස සිරිත් හා ආචාර විධි පිළිබඳ නිවන්තකවේතිය මහා විද්‍යාලයේ සිසුන් 80 දෙනෙකු සහ තලාව මහා විද්‍යාලයේ සිසුන් 120 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ සේවා නියුක්තිය සම්බන්ධයෙන් අනුරාධපුර පළාත් පාසලේ සිසුන් 100 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- කෑම මේස සිරිත් හා ආචාර විධි පිළිබඳ අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් 20 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

5.2 බණ්ඩාරවෙල පළාත් පාසල



වර්ෂ 1990 දී උඩව පළාත් සභාවේ සහය ඇතිව ආරම්භ කරනු ලැබූ බණ්ඩාරවෙල පළාත් පාසල වර්ෂ 2004 දී වත්මන් පරිශ්‍රය වෙත ගෙන එන ලදී.

පවතින පහසුකම්

- දේශන ශාලා 05
- පුහුණු ආපනශාලා 01
- පුහුණු මුළුතැන්ගෙය 01
- මොක් අප් කාමර 02
- පරිගණක විද්‍යාගාර 01
- පුස්තකාල 01
- ශ්‍රවණාගාර 01

අධ්‍යයන කාර්ය මණ්ඩලය

විදුහල්පති : චමින්ද තෙන්නකෝන් මහතා

පාඨමාලාව	දේශක	තනතුර
වෘත්තීය සූපවේදය	ආර්. බණ්ඩාර වෙත්තසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ඊ. එල්. කේ. පෙරේරා මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර පාන මෙහෙයුම්	සංජීව එල්ලාවල මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	චමිලා රත්නායක මෙනෙවිය	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	සී.පී. හෙට්ටිආරච්චි මහතා	සහකාර කථිකාචාර්ය

සටහන : තවද, බාහිර කථිකාචාර්යවරු 12 ක් සිටින ලදී.

2019 සහ 2020 වසරවලදී පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව

වගුව 4. 2019 සහ 2020 වසරවලදී බණ්ඩාරවෙල පළාත් පාසලේ පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	79	32
	අවන්හල් සහ බීම හල් සේවා	100	26
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	55	11
	හෝටල් ගෘහ පාලනය	18	22
උප එකතුව - ශිල්පීය මට්ටම		**252**	**91**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	57	29
	අවන්හල් සහ බීම හල් සේවා	54	28
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	64	17
	හෝටල් ගෘහ පාලනය	59	28
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**234**	**102**
මුළු එකතුව		**486**	**193**



බණ්ඩාරවෙල පළාත් පාසලේ 2019 සහ 2020 දී පාඨමාලා සඳහා පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 486 සහ 193 වූ අතර එය 39.7% ක අඩුවීමකි.

2020 වසරේදී පවත්වන ලද වෘත්තීය සංවර්ධනය සහ වෙනත් වැඩසටහන්

පහත සඳහන් පාසල්වල සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

- 2020 පෙබරවාරි 13 බුත්තල දුටුගැමුණු විද්‍යාලය.
- 2020 පෙබරවාරි 14 මල්වත්තවල මධ්‍ය මහා විද්‍යාලය.
- 2020 සැප්තැම්බර් 02 යක්කල චන්ද්‍රජෝති විද්‍යාලය.
- 2020 සැප්තැම්බර් 16 කුඩා කුසුම් බාලිකා විද්‍යාලය.
- 2020 සැප්තැම්බර් 24 කහගොල්ල මහා විද්‍යාලය.

පවත්වන ලද අනෙකුත් දැනුවත් කිරීමේ වැඩසටහන්

- 2020 දෙසැම්බර් 12 වන දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහාය ඇතිව බණ්ඩාරවෙල අඩු ආදායම්ලාභී පවුල් සඳහා
- 2020 සැප්තැම්බර් 03 දින සබරගමුව විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් සඳහා
- 2020 සැප්තැම්බර් 29 දින රැකියා විරහිත උපාධිධාරීන් සඳහා
- 2020 ඔක්තෝබර් 06 දින කාන්තා සංවර්ධන නිලධාරීන් සඳහා

5.3 කොළඹ පළාත් පාසල



ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) කලින් ලංකා හෝටල් පාසල ලෙස හැඳින්වූ අතර 1966 දී පාර්ලිමේන්තු පනතක් මගින් තරුණ තරුණියන් සංචාරක හා හෝටල් කළමණාකරණය පිළිබඳ පුහුණු කිරීම සඳහා පිහිටුවන ලදී. එය කළමනාකරණය කරනු ලැබුවේ ලංකා සංචාරක මණ්ඩලය විසිනි. එය මුලින් පිහිටා තිබුණේ කොළඹ පාක් වීදියේ ය. එය 1980 දී ගල්කිස්ස පාම් බීච් හෝටලයට සහ 1994 දී නාවලට ගෙන යන ලදී. ලංකා හෝටල් පාසල ශ්‍රී ලංකා සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ ආයතනය බවට පරිවර්තනය කිරීම 2005 අංක 38 සංචාරක පනත යටතේ සිදු කරන ලදී. වර්තමානයේ දී ආයතනය කර්මාන්තයේ ඉල්ලුමට සරිලන පරිදි බොහෝ පාඨමාලා සැලසුම් කර ඇත. එම පාඨමාලා නම් ශිල්පීය, සහතික, අතරමැදි, උසස් හා කළමනාකරණ මට්ටම් වන අතර ජාතික හා සංචාරක රියැදුරු සංචාරක මාර්ගෝපදේශ පාඨමාලා පවත්වන ලදී. මීට අමතරව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ වෙනත් ආයතන සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් ද පවත්වයි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය අංක 78, ගාලු පාර, කොළඹ - 03 ස්ථානයේ පිහිටා ඇති අතර එහි මෙහෙයුම් 2000 අගෝස්තු 15 දින ආරම්භ විය.

පවතින පහසුකම්

- දේශන ශාලා 23
- පුහුණු ආපනශාලා 02
- මොක් අප් කාමර 02
- පුහුණු මුළුතැන්ගෙවල් 04
- පරිගණක විද්‍යාගාර 01
- පුස්තකාල 01
- භෝජනාගාර 01

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2020

විදුහල්පති : සමන් හතුරුසිංහ මහතා

පාඨමාලාව	දේශක	තනතුර
වෘත්තීය සූපවේදය	නිශාන්ත කුලතුංග මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (අංශ ප්‍රධානී)
	එච්. එම්. බී. ලංකාපුර බණ්ඩාර මහතා	සහකාර කථිකාචාර්ය
	වයි. බී. එම්. ආර්. යාපාබණ්ඩාර මහතා	සහකාර කථිකාචාර්ය
	එච්. එම්. ටී. හේරත් මහතා	සහකාර කථිකාචාර්ය
	එස්. ඒ. එන්. විරාජ් මහතා	සහකාර කථිකාචාර්ය
	එම්. එන්. විරංග මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර පාන මෙහෙයුම්	එම්. කේ. ඩික්සන් කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (අංශ ප්‍රධානී)
	ලක්මාල් පෙරේරා මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (කොන්ත්‍රාත්)
	දර්ශන ජයසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	තරින්ද වීරරත්න මහතා	සහකාර කථිකාචාර්ය
	එච්. එම්. පී. මංජුල මහතා	සහකාර කථිකාචාර්ය
පේස්ට්‍රි සහ බේකරි	එම්. ඩී. රුවන්ත ප්‍රසාද් මහතා	සහකාර කථිකාචාර්ය
	යූ. පී. පිනිදිය මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	යූ. පී. සිල්පතිලක මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (අංශ ප්‍රධානී)
	ඩී. ටී. සේනාරත්න මහතා	සහකාර කථිකාචාර්ය
	ඩබ්. එන්. බී. මෙන්ඩිස් මිය	සහකාර කථිකාචාර්ය
	බ්‍රයන් බෙනඩික්ට් මහතා	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	ඒ. එල්. ඩී. එල්. පෙරේරා මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (අංශ ප්‍රධානී)
	නාමල් මුහන්දිරම්ගේ මහතා	කථිකාචාර්ය
	ඒ. ආර්. ජයසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ඒ. එම්. කේ. ඩබ්. කේ. අබේකෝන් මහතා	සහකාර කථිකාචාර්ය
සංචරණ සහ සංචාරක කළමනාකරණය	සුජිත් යමසිංහ මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (අංශ ප්‍රධානී)
	පී. එම්. සුරවීර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	ධීර හෙට්ටිආරච්චි මහතා	සහකාර කථිකාචාර්ය
	අනුර ශාන්ත මහතා	සහකාර කථිකාචාර්ය
ඉංග්‍රීසි භාෂා අංශය	ලතීෂා රාමනායක මිය	සහකාර කථිකාචාර්ය

සටහන : මීට අමතරව බාහිර කථිකාචාර්යවරු 27 දෙනෙකු ද සිටින ලදී.

2019 සහ 2020 වසරවලදී පුහුණුවලත් සිසුන් සංඛ්‍යාව

වගුව 5. 2019 සහ 2020 දී කොළඹ පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	106	24
	අවන්හල් සහ බීම හල් සේවා	97	24
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	81	8
	හෝටල් ගෘහ පාලනය	74	16
උප එකතුව - ශිල්පීය මට්ටම		**358**	**72**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	101	33
	අවන්හල් සහ බීම හල් සේවා	101	33
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	109	40
	හෝටල් ගෘහ පාලනය	111	37
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**422**	**143**
අතරමැදි මට්ටම	වෘත්තීය සූපවේදය	16	13
	ආහාර පාන මෙහෙයුම්	30	19
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	12	9
	හෝටල් ගෘහ පාලනය	16	6
උප එකතුව - අතරමැදි මට්ටම		**74**	**47**
උසස් මට්ටම	වෘත්තීය සූපවේදය	16	-
	ආහාර පාන මෙහෙයුම්	30	-
	නවාතැන් සැපයුම් මෙහෙයුම්	28	-
උප එකතුව - උසස් මට්ටම		**74**	**-**
කළමනාකරණ ඩිප්ලෝමා (වසර 03)		59	46
පේස්ට්‍රි සහ බේකරි පාඨමාලාව		69	73
ජාතික මාර්ගෝපදේශනය - වෙනත් භාෂා		118	50
ෂෝෆර් මාර්ගෝපදේශනය - ඉංග්‍රීසි භාෂාව		41	77
ආධුනිකත්ව වැඩසටහන		29	-
වික්‍රමාන්විත සංචාරක වැඩසටහන් (Adventure Tourism)		13	-
මුළු එකතුව		**1,257**	**508**



කොළඹ පළාත් පාසලේ SLITHM පාඨමාලා සඳහා පුහුණුව ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව 2019 දී 1,257 ක් වූ අතර 2020 දී 508 ක් විය. (මෙම අඩුවීම COVID වසංගතය හේතුවෙන් බවට හඳුනාගෙන ඇත.)

2020 දී කොළඹ පළාත් පාසලේ SLITHM හි අධ්‍යයන අංශ විසින් පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්

- 2020 පෙබරවාරි 28 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කැබින් සේවකයින් 6 දෙනෙකු සඳහා ආහාර හා පාන අංශ විසින් නේවාසිකව ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී.
- 2020 මැයි 22 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය සිසුන් 300 දෙනෙකු සඳහා ආහාර හා පාන අංශය විසින් රාත්‍රී භෝජන සංග්‍රහ හා වෘත්තීය වැඩමුළුව පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 24 වන දින අගමැති මධ්‍යම විද්‍යාලයේ සිසුන් 20 දෙනෙකු සඳහා අධ්‍යයන අංශ හතරම සමග එක්ව රාත්‍රී භෝජන සංග්‍රහ පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

2020 දී කොළඹ පළාත් පාසලේ SLITHM හි අධ්‍යයන අංශ විසින් පවත්වන ලද ආදායම් උත්පාදන වැඩසටහන්

- 2020 ජනවාරි 19 සිට 31 දක්වා ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් 26 දෙනෙකු සඳහා පණිවුඩ කළමනාකරණය පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.
- 2020 මාර්තු 14 වන දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ කාර්යාල සහායකයින් 30 දෙනෙකු සඳහා සාමාන්‍ය ආගන්තුක සත්කාර සහ ආහාර පාන සේවා ප්‍රමිතීන් හා ආචාර විධි පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- 2020 අගෝස්තු 15, 16, 22 සහ 23 යන දිනවල ගුවන්තොටුපල සහ ගුවන් සේවා බංගලා භාරකරුවන් 31 දෙනෙකු සඳහා බංගලා භාරකරුවනට අදාළ ආහාර පිසීම්, ආහාරපාන සහ ගෘහ පාලන අංශ පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 26 දින අධිකරණ අමාත්‍යාංශයේ කාර්යාල සහායකයින් 32 දෙනෙකු සඳහා සාමාන්‍ය ආගන්තුක සත්කාරය, ආහාරපාන, සේවා ප්‍රමිති සහ ආචාර විධි පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

2020 දී කොළඹ පළාත් පාසල - SLITHM විසින් සංවිධානය කරන ලද අනෙකුත් විශේෂ ක්‍රියාකාරකම්.

- SLITHM හි සංචාරක සමාජය විසින් UNWTO "සංචාරක හා ග්‍රාමීය සංවර්ධනය" යන ගෝලීය තේමාව යටතේ 2020 සැප්තැම්බර් 28 වන දින SLITHM ශ්‍රවණාගාරයේදී "ශිෂ්‍ය දැනුම හුවමාරු කිරීමේ තරඟය" සංවිධානය කරන ලදී.
- කොළඹ ශිෂ්‍ය ක්‍රීඩා හා සුභසාධක සංගමය 2020 සැප්තැම්බර් 29 වන දින දෙහිවල එස්.ඩී.එස්. ජයසිංහ ක්‍රීඩාංගණයේ අන්තර් පන්ති ක්‍රිකට් තරගාවලිය පවත්වන ලදී.

5.4 මහනුවර පළාත් පාසල



ග්‍රාමීය තරුණ තරුණියන්ට ආගන්තුක සත්කාර කර්මාන්තයේ රැකියා ලබා ගැනීමට උනන්දු කිරීම සඳහා 1992 දී පල්ලෙකැලේ පළාත් පාසල ආරම්භ කරන ලදී. ආරම්භයේ දී මෙම පාසල මහනුවර ක්වීන්ස් හෝටලයේ කොටසක ස්ථාපනය කරන ලද අතර පසුව එය කුණ්ඩසාලේ, වරාපිටියෙහි පිහිටි වර්තමාන ස්ථානයට ගෙන යන ලදී.

පවතින පහසුකම්

- දේශන ශාලා 08 (සෑම එකකම උපරිම සිසුන් සංඛ්‍යාව 35)
- පුහුණු මුළුතැන්ගෙය 01 (ස්ථාන 15) සහ පුහුණු ආපන ශාලා 01 (ආවරණ 40)
- මොක් අප් කාමර 01
- පරිගණක විද්‍යාගාර 01 (ඩෙස්ක්ටොප් 30)
- අමුත්තන්ගේ කාමර 04 (සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා ආදර්ශ කාමර)
- ගෘහ පාලන නිරූපණ කාමර 01
- ශ්‍රවණාගාර 01 (ආසන 100)
- එළිමහන් රංගපීඨ 01
- පුස්තකාල 01
- භෝජන සංග්‍රහ ශාලා 01 (ධාරිතාව - 150)

අධ්‍යයන කාර්ය මණ්ඩලය

විදුහල්පති : කුමුදුනී වික්‍රමසිංහ මිය

පාඨමාලාව	දේශක	තනතුර
වෘත්තීය සූපවේදය	පී.ජේ.ද අල්විස් සෙනෙවිරත්න මහතා (2020 සැප්තැම්බර් 30 දක්වා)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	ජනක පෙරේරා මහතා	සහකාර කථිකාචාර්ය
	සංදීප් රත්නසාමි මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර පාන මෙහෙයුම්	අයි.ඒ.එස්.බී. දිසානායක මහතා	සහකාර කථිකාචාර්ය
	රසික අතුකෝරල මහතා	සහකාර කථිකාචාර්ය
	අමිල අල්විස් මහතා	සහකාර කථිකාචාර්ය
පෝෂණය සහ ආහාර ස්වස්ථතාව	කේ.පී.එස්.ඩී. ගුණසිංහ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	රියන්සි ජයවර්ධන මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	එම්. සුන්දරම්පිල්ලෙ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	රවින්ද්‍ර සෙනෙවිරත්න මහතා	සහකාර කථිකාචාර්ය

සටහන : ඉහත මූලික විෂය කථිකාචාර්යවරුන්ට අමතරව, පිළිගැනීමේ, ඉවුම් පිහුම් හා ගෘහ පාලක විෂයයන් සඳහා බාහිර කථිකාචාර්යවරුන් 04 ක් සහ සහතික මට්ටමේ සහ වසර 03 ක කළමනාකරණ ඩිප්ලෝමා මට්ටමේ විෂයයන් වෙනුවෙන් උපකාරක විෂයයන් සඳහා බාහිර කථිකාචාර්යවරුන් 20 දෙනෙකු ද සිටින ලදී.

2019 සහ 2020 වසරවලදී පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව

වගුව 6. 2019 සහ 2020 වසරවලදී මහනුවර පළාත් පාසලේ පුහුණුවලත් සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	82	30
	අවන්හල් සහ බීම හල් සේවා	76	22
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	37	-
	හෝටල් ගෘහ පාලනය	43	15
උප එකතුව - ශිල්පීය මට්ටම		**238**	**67**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	122	49
	අවන්හල් සහ බීම හල් සේවා	105	48
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	62	25
	හෝටල් ගෘහ පාලනය	45	19
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**334**	**141**
කළමනාකරණ ඩිප්ලෝමා (වසර 3)		39	20
මුළු එකතුව		**641**	**228**



මහනුවර පළාත් පාසලේ පුහුණුව ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 2019 සහ 2020 වර්ෂ සඳහා 641 සිට 228 දක්වා අඩු විය. එය 35.5% ක අඩුවීමකි.

2020 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධනය සහ වෙනත් වැඩසටහන්

- පෙබරවාරි 2020 දී පළාත් ශ්‍රවණාගාරයේදී සිසුන් විසින් කුසලතා සංදර්ශන වැඩසටහන පවත්වන ලදී.
- ලෝක සංචාරක දින සැමරුම පිළිබඳව SLITHM මහනුවර සිසුන් විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන සහ 2020 සැප්තැම්බර් මාසයේදී KCC මහනුවරදී සූපශාස්ත්‍ර ප්‍රවර්ධන වැඩසටහන සඳහා සහභාගී විය.
- මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ TEVC ඒකකය විසින් සංවිධානය කරන ලද ග්‍රාමීය තරුණ තරුණියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ගෘහ පාලනය, ආහාරපාන හා මුළුතැන්ගෙයි ක්‍රියාකාරිත්වය පිළිබඳ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික පුහුණු නිලධාරීන් සඳහා පවත්වන ලද එක් දින දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- COVID - 19 සමඟ නව සම්මතයන් පිළිබඳව ආරාධිත දේශනය පෙරිත් ඩීන් මහතා විසින් පවත්වන ලදී.

5.5 කොග්ගල පළාත් පාසල



1992 වර්ෂයේදී වැලිගම බේ හෝටලයේ ආරම්භ කරන ලද මෙම හෝටල් පාසල තුලින් පුහුණු පාඨමාලා සිදු කළ අතර පාඨමාලා සඳහා පවතින ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම සඳහා 2008 වර්ෂයේ දී මෙම හෝටල් පාසල කොග්ගල වර්තමාන පරිශ්‍රය වෙත ගෙන යන ලදී.

පවතින පහසුකම්

- පන්ති කාමර 06 (සෑම එකකටම සිසුන් 30 බැගින්)
- පුහුණු මුළුතැන්ගෙය 01
- ගබඩා 01
- පුහුණු ආපනශාලා 01
- මොක් අප් කාමර 02
- පරිගණක විද්‍යාගාර 01
- පුස්තකාලය

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2020

විදුහල්පති : ආර්.ඩී.ඒ. ලෙනාඩ් මහතා

පාඨමාලාව	දේශක	තනතුර
වෘත්තීය සූපවේදය	ඩබ්.එම්.ආර්.බී. වෙත්තසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ජී. පේරුසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ටී.බී. චාමර මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර පාන මෙහෙයුම්	එම්.ඒ. බුද්ධික මහතා	සහකාර කථිකාචාර්ය
	එල්.එස්. වසන්ත මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	එච්.කේ.ඩබ්. චන්දන මහතා	සහකාර කථිකාචාර්ය
	එච්.එල්.ඒ. සමන්මලී මිය	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	ඉන්දික මොහොට්ටි මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	පී.එස්.ඩබ්. එම්මානුවෙල් මහතා	සහකාර කථිකාචාර්ය

සටහන : මීට අමතරව විට බාහිර කථිකාචාර්යවරු 12 ක් සිටින ලදී.

2019 සහ 2020 වසරවලදී පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව

වගුව 7: 2019 සහ 2020 වසරවලදී කොග්ගල පළාත් පාසලේ පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	152	75
	අවන්හල් සහ බීම හල් සේවා	128	70
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	59	62
	හෝටල් ගෘහ පාලනය	31	56
උප එකතුව - ශිල්පීය මට්ටම		**370**	**263**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	137	83
	අවන්හල් සහ බීම හල් සේවා	153	64
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	126	51
	හෝටල් ගෘහ පාලනය	123	40
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**539**	**238**
මුළු එකතුව		**909**	**501**



කොග්ගල පළාත් පාසලේ, ඉහත පාඨමාලා සඳහා පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව 2019 සහ 2020 දී පිළිවෙලින් 909 සිට 501 දක්වා අඩු විය.

2020 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධනය සහ වෙනත් වැඩසටහන්

- හෝල් ඩි ගෝල් හි පැවති "පළමුව දැනුම" ප්‍රදර්ශනය සඳහා සිසුන් 100 ක් සහභාගී විය.
- 2020 සැප්තැම්බර් 24 සිට සැප්තැම්බර් 29 දක්වා සිසුන් සඳහා වොලිබෝල් තරඟාවලිය සංවිධානය කරන ලදී.
- ශිල්පීය මට්ටමේ (වෘත්තීය ඉවුම් පිහුම්) සිසුන් 83 දෙනෙකු සහ ශිල්පීය මට්ටමේ (ඉදිරිපස කාර්යාල) සිසුන් 51 දෙනෙකු පැමිණ ගාල්ලේ තරු පන්තියේ හෝටලයක පුහුණුව ලබා දෙන ලදී.

5.6 රත්නපුර පළාත් පාසල



ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) රත්නපුර පළාත් පාසල යනු සබරගමුව පළාතේ පිහිටි ආගන්තුක සත්කාර, චාරිකා හා සංචාරක පාසල වේ. මෙය 2010 අගෝස්තු 31 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් විවෘත කරන ලදී. වෙනත් නගර වලින් වුවද පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක මෙම පාසල පිහිටා තිබේ. හෝටල් මෙහෙයුම් කුසලතා, සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තය පිළිබඳ දැනුම සහ වෙනස්වන ගෝලීය ආගන්තුක සත්කාර පරිසරය සඳහා නැවුම් පාඨමාලා පිළිබඳව ද අවධානය යොමු කරනු ලැබේ.

පවතින පහසුකම්

- දේශන ශාලා 06
- පුහුණු ආපන ශාලා 01
- පුහුණු මුළුතැන්ගෙය 01
- මොක් අප් කාමර 02
- ශිෂ්‍ය ආපනශාලා 01
- පරිගණක විද්‍යාගාර 01

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2020

විදුහල්පති : කණිෂ්ක එන්. ජයතුංග මහතා

පාඨමාලාව	දේශක	තනතුර
වෘත්තීය සූපවේදය	ප්‍රියංක වික්‍රමසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ඩබ්.එම්.ඒ.ආර්. විජේකෝන් මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර පාන මෙහෙයුම්	ටී.එම්.කේ.සී.එස්.ආර් පීරිස් මහතා	සහකාර කථිකාචාර්ය
	කාංචන ක්‍රිශාන්ත මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	සී.ටී. ගුණසේකර මහතා	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	කණිෂ්ක ඩී. නුගවෙල මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

සටහන : මීට අමතරව බාහිර කථිකාචාර්යවරු 10 ක් ද සිටින ලදී.

2019 සහ 2020 වසරවලදී පුහුණුවලත් සිසුන් සංඛ්‍යාව

වගුව 8: 2019 සහ 2020 වසරවලදී රත්නපුර පළාත් පාසලේ පුහුණුවලත් සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	77	28
	අවන්හල් සහ බීම හල් සේවා	71	29
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	26	-
	හෝටල් ගෘහ පාලනය	60	16
උප එකතුව - ශිල්පීය මට්ටම		**234**	**73**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	62	35
	අවන්හල් සහ බීම හල් සේවා	60	31
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	58	28
	හෝටල් ගෘහ පාලනය	51	31
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**231**	**125**
මුළු එකතුව		**465**	**198**



රත්නපුර පළාත් පාසලේ ප්‍රහුණුව ලත් සිසුන් සංඛ්‍යාව 2019 දී 465 ක් වූ අතර 2020 දී 198 ක් විය.

2020 වසරේදී පවත්වන ලද වෘත්තීය සංවර්ධන සහ වෙනත් වැඩසටහන්

- 2020 පෙබරවාරි 28 වන දින ලෙල්ලෝපිටිය රාහුල පාසලේ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය සහ ප්‍රවර්ධන වැඩසටහන පවත්වන ලදී.
- 2020 ජුනි 09 වන දින බටංගල පාසලේ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය සහ ප්‍රවර්ධන වැඩසටහන පවත්වන ලදී.
- 2020 අගෝස්තු මස 02 වන දින රත්නපුර ඇහැලියගොඩ විද්‍යාලයේ සිසුන් සඳහා පාසල් දැනුවත් කිරීම සහ මේස ආචාර විධි හා මේස සිරිත් විරිත් වැඩසටහන පවත්වන ලදී.
- 2020 අගෝස්තු 20 වන දින රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය සහ ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
- 2020 අගෝස්තු 26 දින රත්නපුර ධර්මපාල විද්‍යාලයේ සිසුන් සඳහා පාසල් දැනුවත් කිරීම සහ මේස ආචාර විධි සහ මේස සිරිත් විරිත් වැඩසටහන් පවත්වන ලදී.
- රුවන්වැල්ල විද්‍යාලයේ සිසුන් සඳහා 2020 අගෝස්තු 27 දින පාසල් දැනුවත් කිරීම සහ මේස ආචාර විධි සහ මේස සිරිත් විරිත් වැඩසටහන පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 15 වන දින දෑල දෙමළ විද්‍යාලයේ සිසුන් සඳහා පාසල් දැනුවත් කිරීම සහ මේස ආචාර විධි සහ මේස සිරිත් විරිත් වැඩසටහන පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 15 වන දින බටංගල පාසලේ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය සහ ප්‍රවර්ධන වැඩසටහන පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 17 වන දින ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශයේ නිලධාරීන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය සහ ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 17 දින රත්නපුර තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය සහ ප්‍රවර්ධන වැඩසටහන පවත්වන ලදී.
- රත්නපුර හෙද පාසලේ හෙද සිසුන් සඳහා 2020 සැප්තැම්බර් 22 දින පාසල් දැනුවත් කිරීම සහ මේස ආචාර විධි සහ මේස සිරිත් විරිත් වැඩසටහන පවත්වන ලදී.
- පුස්සැල්ල විද්‍යාලයේ සිසුන් සඳහා 2020 සැප්තැම්බර් 29 දින පවත්වන ලද පාසල් දැනුවත් කිරීම් සහ මේස ආචාර විධි සහ මේස සිරිත් විරිත් වැඩසටහන පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 29 වන දින අරනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය සහ ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

5.7 කුරුණෑගල පළාත් පාසල



කුරුණෑගල හෝටල් පාසල 1997 දී කුරුණෑගල මහනුවර පාරේ කැන්ඩියන් රීච් හෝටලයේදී ආරම්භ කරන ලදී. වයඹ පළාත් සභාව යටතේ වයඹ සංවර්ධන අධිකාරිය (WDA) සමඟ එක්ව SLITHM හි කුරුණෑගල පළාත් පාසල 2015 දී වර්තමාන පරිශ්‍රය වෙත ගෙන යන ලදී.

පවතින පහසුකම්

- දේශන කාමර 04 (සෑම එකකම සිසුන් 30 බැගින්)
- පුහුණු මුළුතැන්ගෙය 01
- පුහුණු ආපන ශාලා 01
- මොක් අප් කාමර 01
- පරිගණක විද්‍යාගාර 01
- ශ්‍රවණාගාර 01
- ආපන ශාලා 01
- පුස්තකාල 01

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2020

විදුහල්පති : ඊ.කේ. සරත් කුමාර මහතා (2020 මාර්තු දක්වා)
ජේ.එස්.බී. වීරකෝන් මහතා (2020 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා වැඩබලන විදුහල්පති)
රියන්සි ජයවර්ධන මහතා (2020 ඔක්තෝබර් සිට)

පාඨමාලාව	දේශක	තනතුර
වෘත්තීය සූපවේදය	ජේ.එස්.බී. වීරකෝන් මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආහාර පාන මෙහෙයුම්	එච්.එම්.අයි.බී.සෙනෙවිරත්න මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	ඩබ්.එම්.එස්.බී. වීරකෝන් මහතා	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	එම්.බී.ජේ.එම්.බී. ජයසේකර මහතා	සහකාර කථිකාචාර්ය

සටහන : මීට අමතරව බාහිර කථිකාචාර්යවරු 12 ක් ද සිටින ලදී.

2019 සහ 2020 වර්ෂවලදී පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව

වගුව 9: 2019 සහ 2020 වසරවලදී කුරුණෑගල පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	77	38
	අවන්හල් සහ බීම හල් සේවා	70	31
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	25	28
	හෝටල් ගෘහ පාලනය	-	49
උප එකතුව - ශිල්පීය මට්ටම		**172**	**146**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	75	31
	අවන්හල් සහ බීම හල් සේවා	73	31
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	118	51
	හෝටල් ගෘහ පාලනය	100	45
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**366**	**158**
ආධුනිකත්ව වැඩසටහන		41	-
මුළු එකතුව		**579**	**304**



පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 2019 සහ 2020 දී 579 සිට 304 දක්වා අඩු විය.

2020 වසරේදී පවත්වන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන්

- 2020 ජනවාරි මස පළමුවැනිදා සැමරීම සඳහා රුක් රෝපණ වැඩසටහන පාසලේ සියලුම කාර්ය මණ්ඩලය සහභාගී කර ගනිමින් පවත්වන ලදී.
- කුරුණෑගල රෝහලේ එච්.අයි.වී අංශය විසින් 2020 පෙබරවාරි 24 වන දින ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සිසුන් හා කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වන ලදී.
- 2020 මාර්තු 10 වන දින වයඹ විශ්ව විද්‍යාලයේ දේශන සහ සිසුන් සඳහා කෑම මේස සිරිත් විරිත් හා ආචාර විධි පිළිබඳ වැඩමුළුව පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 16 වන දින කුරුණෑගල ශාන්ත ආනා විද්‍යාලයේ, 2020 සැප්තැම්බර් 29 වන දින කුරුණෑගල ඩෙමටලුව මධ්‍ය මහා විද්‍යාලයේ සහ 2020 ඔක්තෝබර් 02 දින කුරුණෑගල මාස්පොත මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් සඳහා කෑම මේස ආචාර විධි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 21 දින මහව කලාපීය අධ්‍යාපන කාර්යාලය විසින් සංවිධානය කරන ලදුව විජයබා ජාතික පාසලේ 13 වසරක සහතික අධ්‍යාපනය සඳහා සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 23 වන දින කුරුණෑගල පොලිස් ඇකඩමියේ පොලිස් පුහුණු නිලධාරීන් සඳහා පෞරුෂ සංවර්ධනය හා හෝජන ආචාර විධි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී.
- 2020 සැප්තැම්බර් 26 දින අබිමන්සල සුවතා නිකේතනයේ ආබාධිත සොල්දාදුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී.

5.8 පාසිකුඩා පළාත් පාසල



ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ මූලික පාඨමාලාවන් හැදෑරීම සඳහා 2015 දී පාසිකුඩා හි ජාතික නිවාඩු නිකේතන කාර්යාලයේ තාවකාලිකව හෝටල් පාසලක් ආරම්භ කිරීමට SLITHM තීරණය කළේය. 2017 වන විට පාසිකුඩා පළාත් පාසලට හෝටල් ගෘහ පාලන සහ ආපනශාලා සහ බීමහල් සේවා සහ ආධුනිකත්ව මට්ටම වැනි වෙනත් ශිල්පීය මට්ටමේ පාඨමාලා පැවැත්වීමට අවස්ථාව ලැබුණි.

ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2020

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ භාර නිළධාරී : ජී.එල්.බී. රමේෂ් පෙරේරා මහතා

පාඨමාලාව	දේශක	තනතුර
ආහාර පාන මෙහෙයුම්	ඒ.එම්.ජේ.කේ. අත්තනායක මහතා	සහකාර කථිකාචාර්ය
හෝටල් ගෘහපාලනය	ඒ.එම්. රිසාන් මහතා	සහකාර කථිකාචාර්ය

මීට අමතරව, ඉංග්‍රීසි භාෂාව සඳහා බාහිර කථිකාචාර්යවරයකු සිටින ලදී.

2019 සහ 2020 වර්ෂවලදී පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව

වගුව 10: 2019 සහ 2020 වර්ෂවලදී පාසිකුඩා පළාත් පාසලේ පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	-	-
	අවන්හල් සහ බීම හල් සේවා	33	37
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	-
	හෝටල් ගෘහ පාලනය	47	-
උප එකතුව - ශිල්පීය මට්ටම		**80**	**37**
ආධුනිකත්ව වැඩසටහන		20	-
මුළු එකතුව		**100**	**37**



කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මුළු සිසුන් සංඛ්‍යාව 2019 සහ 2020 දී පිළිවෙලින් 100 සිට 37 දක්වා අඩු විය.

2020 වසරේදී පවත්වන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන්

- හුරුපුරුදු කිරීමේ චාරිකා : ආපනශාලා සහ බාර් සේවා හුරුපුරුදු චාරිකා අනන්තය හෝටලය - පාසිකුඩා සහ මරීනා බීච් රිසෝට් - පාසිකුඩා.
- වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් : වාලච්චෙනෙයි, ඔඩ්ටමාවඩි සහ චෙන්කලඩි යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී පවත්වන ලදී.
- දැනුවත් කිරීමේ වැඩසටහන් : ඔඩ්ඩමාවාඩි හි විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානය, World Vision පුහුණු මධ්‍යස්ථානය - චෙන්කලාඩි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වාලච්චෙනෙයි.
- WUSC විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වාලච්චෙනෙයි සහ වයි.එම්.සී.ඒ - වලයිවෙනෙයි සමඟ එක්ව තරුණ වැඩමුළු සාකච්ඡාව.
- නැගෙනහිර විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද කුඩා රැකියා ප්‍රදර්ශනයකට සහභාගී වීම.
- ඔඩ්ඩමාවාඩි සහ වාලච්චෙනෙයි කොට්ඨාශවල සියලුම පාසල් අතර පෝස්ටර් බෙදා හරින ලදී.
- රජයේ වාලච්චෙනෙයි සහ ඔඩ්ඩමාවාඩි හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්යාල, තැපැල් කාර්යාල, මහජන පුස්තකාල, බැංකු සහ සුපිරි වෙළඳසැල් අතර පෝස්ටර් බෙදා දෙන ලදී.
- පාසිකුඩා හි හෝටල් සංගමය සමඟ ලෝක සංචාරක දිනය සමරනු ලැබීය.
- හුරුපුරුදු කිරීමේ (Familiarization Tours) චාරිකා: අමායා බීච් - පාසිකුඩා අවන්හල් සහ බීමහල් සේවා හුරුපුරුදු කිරීමේ සංචාරය පෙට්වින් - පාසිකුඩා විසින් සන්රයිස් හෝටල් වෙත.

5.9 යාපනය පළාත් පාසල

SLITHM යාපනය පළාත් පාසල 2018 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. මෙම පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ උතුරු පළාතේ සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයේ නියුතු මිනිස්බල හිඟය මැඩපැවැත්වීමයි. මෙම පියවර නිසා උතුරු පළාතේ තරුණ තරුණියන්ට ආගන්තුක සත්කාර කර්මාන්තයේ සුදුසු රැකියා ලබා ගැනීමට හැකි වී තිබේ. ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ හෝටල් සහ නිකේතන කිහිපයක් විවෘත කර ඇති අතර මෙම පහසුකම විවෘත කිරීමෙන් නිපුණතා සහිත මිනිස්බල හිඟය පියවනු ඇත.

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2020

සහකාර කථිකාචාර්ය සහ භාර නිළධාරිනී : නිරංජලා ෆ්‍රැන්සිස් බැස්ටියන් මිය

සටහන : ස්ථිර කථිකාචාර්යවරයකු සිටි අතර බාහිර කථිකාචාර්යවරු තිදෙනෙකු ද සිටින ලදී.

2019 සහ 2020 වර්ෂවලදී පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව

වගුව 10: 2019 සහ 2020 වර්ෂවලදී යාපනය පළාත් පාසලේ පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලාව	උප පාඨමාලාව	2019	2020
ශිල්පීය මට්ටම	සූපවේදය	-	-
	අවන්හල් සහ බීම හල් සේවා	17	18
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	6	-
	හෝටල් ගෘහ පාලනය	-	18
උප එකතුව - ශිල්පීය මට්ටම		**23**	**36**
මුළු එකතුව		**23**	**36**



ඉහත වගුවට අනුව, යාපනය පළාත් පාසලේ පුහුණුව ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 2019 සහ 2020 දී 23 සිට 36 දක්වා වැඩි කරන ලදී.

2020 වසරේදී පවත්වන ලද වෘත්තිය සංවර්ධන සහ වෙනත් පාඨමාලා

- 2020 ජනවාරි 02 වන දින පාසල් ගුරුවරුන් සහ දෙමාපියන් සඳහා හෝටල් කර්මාන්තය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- 2020 අගෝස්තු 11 වන දින ජෙට්විංග් (Jetwing) යාපනය හෝටලය නැරඹීමට සිසුන් සහභාගි විය.
- 2020 අගෝස්තු 13 වන දින වාලම්පුරි හෝටලයේ ගෘහ පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා ශිල්පීය මට්ටමේ සිසුන් සහභාගී විය.

6. ප්‍රධාන කාර්යාලයේ අංශවල කාර්ය සාධනය

6.1 ලේඛකාධිකාරි කාර්යාලය

ලේඛකාධිකාරි කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

- SLITHM හි සිසුන් බඳවා ගැනීම හා වාර්තා තබා ගැනීම.
- විභාග පැවැත්වීම, සියලු මට්ටම්වල ප්‍රතිඵල නිකුත් කිරීම සහ සුදුසුකම් ලත් සිසුන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම.
- ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- බාහිර කථිකාචාර්යවරු පත්කිරීම සහ ඔවුන්ගේ ගිවිසුම් පවත්වාගෙන යාම.
- වෘත්තීය තේරීම් සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම.

SLITHM හි පහත සඳහන් පාඨමාලා පැවැත්වේ.

වසර 04 කළමනාකරණ ඩිප්ලෝමාව :

සහතික මට්ටමේ පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු අතරමැදි හා උසස් මට්ටමේ පාඨමාලා කොළඹදී පවත්වනු ලැබේ.

වසර 03 කළමනාකරණ ඩිප්ලෝමාව :

අ.පො.ස උසස් පෙළ සුදුසුකම් සහිත සිසුන් සඳහා වසර - 3 කළමනාකරණ ඩිප්ලෝමා වැඩසටහන කොළඹ සහ මහනුවර පාසල්වල පවත්වනු ලැබේ.

සහතිකපත්‍ර මට්ටම :

අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා විධිමත් අධ්‍යාපනයක් ලබා ඇති සිසුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලා පිරිනැමීමට හැකියාව ලබාදෙන ප්‍රවේශ මට්ටමේ සුදුසුකම් ලබාගත හැකි පාඨමාලාවකි. එය කොළඹ සහ සියලුම පළාත් පාසල්වල පවත්වනු ලැබේ.

පේස්ට්‍රි සහ බේකරි පාඨමාලාව :

එය 2003 දී හඳුන්වා දෙන ලද අතර කොළඹ පාසලේ පමණක් පවත්වනු ලැබේ.

ශිල්පීය මට්ටම :

08 ශ්‍රේණියේ සුදුසුකම් ලැබූ පාසල් හැරගිය අය සඳහා ඇතුළත් වීමේ මට්ටමේ මාස තුනක වැඩසටහනකි. එය කොළඹ සහ සියලුම පළාත් පාසල්වල පවත්වනු ලැබේ.

විශේෂ පුහුණු වැඩසටහන :

රජයේ සහ වෙනත් ආයතනවල විශේෂ ඉල්ලීම් මත පදනම්ව විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ආධුනිකත්ව මට්ටම :

පූර්ව ඇතුළත් වීමේ මට්ටමේ එක් මාසයක වැඩසටහන. මෙම පාඨමාලාව් බෂඕඑ ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් පාසැල්වල පවත්වනු ලැබේ. මාසයක පාඨමාලාව හැදෑරීමෙන් පසු සිසුන්ට් බෂඕඑ විසින් පවත්වනු ලබන ශිල්පීය මට්ටමේ පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැකිය.

සංචාරක මාර්ගෝපදේශන පුහුණු වැඩසටහන :

ජාතික, ඡෝනර්, ප්‍රාදේශීය සහ අඩවි යන මාර්ගෝපදේශ වර්ග හතරක් ඇත. සියලුම සංචාරක මාර්ගෝපදේශ පාඨමාලා ස්වයං මූල්‍යකරණ පාඨමාලා වේ. සුදුසුකම් ලත් මාර්ගෝපදේශකයින් සඳහා බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන ආයතනය විසිනි.

ශිෂ්‍යත්ව වැඩසටහන

SLITHM විසින් අඩු ආදායම්ලාභී සිසුන්ට පාඨමාලා හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. දෙමාපියන්ගේ ආදායම් සීමාව මසකට රුපියල් 25,000 ට වඩා අඩු නම්, සිසුන්ට පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලද අතර 2020 දී සිසුන් 400 කට ශිෂ්‍යත්ව පිරිනමන ලදී.

6.2 මානව සම්පත් සහ පරිපාලන අංශය

මානව සම්පත් අංශයේ කාර්යයන්

- කර්මාන්තයට ගැලපෙන පරිදි ආයතනික සංවිධාන ව්‍යුහය නවීකරණය කිරීම හා ශක්තිමත් කිරීම.
- සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය සඳහා විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස SLITHM පත් කිරීම සඳහා කොළඹ සහ පළාත් පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- කළමනාකරණ අවශ්‍යතාවයට අනුව නව පළාත් විද්‍යාල පිහිටුවීම.
- සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධනය කිරීමට කටයුතු කිරීම.

අනුමත සේවක සංඛ්‍යාවට අනුව, මුළු සේවකයින් සංඛ්‍යාව 218 කි. එයට අධ්‍යයන කාර්යය මණ්ඩලය 84 ක් සහ සමුද්‍රා පුහුණු හෝටලය ඇතුළු අධ්‍යයන නොවන කාර්යය මණ්ඩලය 138 ක් අයත් වේ. 2020 අවසන් වන විට තථ්‍ය සේවක සංඛ්‍යාව 190 ක් වූ අතර විස්තර පහත පරිදි වේ.

වර්ගය	අනුමත කාර්යය මණ්ඩලය	තත්‍ය
අධ්‍යයන කාර්යය මණ්ඩලය	84	75
අනධ්‍යන කාර්යය මණ්ඩලය	106	93
සමුද්‍රා පුහුණු පාසල	28	22
එකතුව	**218**	**190**

අධ්‍යයන හා අනධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්

- ඕස්ට්‍රේලියාවේ තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා විද්වතුන් සිව් දෙනෙකු සහභාගී වී ඇත.
- 2020 පෙබරවාරි 14 වන දින SLITHM හි ලිපිගොනු ක්‍රමය පිළිබඳ කාර්ය මණ්ඩලය 35 ක් සඳහා වැඩමුළුවක් පවත්වා ඇත.
- 2020 ජූනි 18 සහ 19 යන දිනවල SLITHM හි සේවකයින් 35 දෙනෙකු සඳහා ප්‍රසම්පාදන හා මූල්‍ය නියාමනය පිළිබඳ වැඩමුළුවක් පවත්වා ඇත.
- 2020 අගෝස්තු 26 දින ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) විසින් සිදු කරන ලද ඩිජිටල් අලෙවිකරණ වැඩමුළුව සඳහා එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු (සහකාර අධ්‍යක්ෂ - අලෙවි) සහභාගී විය.
- 2020 අගෝස්තු 31 දින ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා ප්‍රවාහන නිලධාරියා සහභාගී වී ඇත.
- 2020 සැප්තැම්බර් 14 සහ 21 යන දිනවල අධ්‍යයන කටයුතු සඳහා මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් 50 දෙනෙකු සඳහා මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇත.

6.3 මුදල් අංශය

SLITHM හි ප්‍රධාන අරමුදල් ප්‍රභවය ලෙස සංචාරක සංවර්ධන බදු මුදලින් 12% SLITHM ආයතනය වෙත ලබා දෙනු ලැබේ. මෙම බදු මුදල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් රැස් කොට එයින් අදාළ මුදල (12%) SLITHM ආයතනය වෙත ලබා දෙනු ලැබේ.

වගුව 12: 2019 සහ 2020 දී SLITHM හි අරමුදල් පහත පරිදි දැක්විය හැකිය.

වර්ගය	2020 (රු.මි.)	2019 (රු.මි.)
සංචාරක සංවර්ධන අරමුදල	85.15	163.77
ගුවන්තොටුපල බද්ද (Embakation Lery)	58.74	250.71
පාසැල් ගාස්තු සහ වෙනත් ආදායම්	42.88	71.08
වෙනත් ආදායම්	62.98	84.79
සමුද්‍රා පුහුණු පාසල	(8.82)	13.63
එකතුව	**240.94**	**583.98**

6.4 අලෙවි සහ මහජන සම්බන්ධතා අංශය

SLITHM අලෙවිකරණ අංශය ආරම්භ කරන ලද්දේ සිසුන්ගේ ප්‍රමාණය සහ වෙළඳනාමය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමේ අරමුණින් ය. ආගන්තුක සත්කාර අංශයේ අධ්‍යාපනයේ තරඟකාරිත්වය වැඩි වෙමින් පවතින අතර පරිසරයේ අස්ථාවර ස්වභාවය නිසා, අනාගත වෙළඳපල අභියෝගයන්ට මුහුණ දීම සඳහා SLITHM හට තවත් අලෙවිකරණ උපාය මාර්ග සහ උපක්‍රම අවශ්‍ය වේ. මෙම අංශය මගින් පහත අරමුණු සාක්ෂාත් කරගනු ලැබේ.

අරමුණු

- පාරිභෝගික තෘප්තිය සහ ගුණාත්මකභාවය විධිමත් කිරීම සඳහා අලෙවිකරණ අරමුණු සහ පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- පාර්ශවකරුවන් අතර SLITHM ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා සියලු සන්නිවේදන මාර්ග වැඩි දියුණු කිරීම.
- SLITHM සන්නාමයේ වටිනාකම් විධිමත් සේවා සපයන්නෙකු ලෙස පාරිභෝගික මනසෙහි ස්ථානගත කිරීම සඳහා එය පුනර්ජීවනය කිරීම.
- සංවිධානයේ ගුණාත්මකභාවය හා ප්‍රමිතිය සංවර්ධනය කිරීම සඳහා සහ විවිධ සහය ලබා ගැනීම සඳහා විවිධ කණ්ඩායම් සමඟ හවුල්කාරිත්ව සහ ජාලකරණ කටයුතු වල නියැලීම.

2020 වසර තුළ සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්

- පළාත් පාසල් පිළිබඳව ප්‍රජාව තුළ දැනුවත් කිරීම සඳහා පුවත්පත් ලිපි ප්‍රකාශයට පත් කිරීම (කොග්ගල, මහනුවර, කුරුණාගල).
- මහනාම විද්‍යාලයේ සිසුන් සඳහා SLITHM වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- මාර්ගස්ථ ඉගෙනුම් ක්‍රමවේදයන් පිළිබඳව පීඨ සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- SLITHM හි අධ්‍යයන වැඩසටහන් පිළිබඳ පුවත්පත් වෙළඳ දැන්වීම් පළ කිරීම.
- SLITHM සඳහා FB පිටුව සහ You Tube නාලිකාව නිර්මාණය කිරීම.
- ලෝක සංචාරක දිනය සැමරීම සඳහා මහනුවර කේ.සී.සී. හි දින 04 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

6.5 තොරතුරු තාක්ෂණ (IT) අංශය

අරමුණු

- තොරතුරු තාක්ෂණය සහ පරිගණක පද්ධති කළමනාකරණය කිරීම.
- පද්ධති,ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- දත්ත, ජාල ප්‍රවේශය සහ උපස්ථ පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීම.
- දෙපාර්තමේන්තු අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (අධ්‍යයන / අනධ්‍යයන), අවදානම් හඳුනා ගැනීම සහ ඉලක්ක සපුරා ගැනීමේ කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාව ඉහළ නැංවීම.
- මෘදුකාංග හා දෘඩාංග යන දෙඅංශයෙන්ම සේවකයින් පුහුණු කිරීම, අවශ්‍ය විටෙක දෝෂ නිරාකරණය සහ තාක්ෂණික සහාය ලබා දීම.
- ජාල සංරචක අවශ්‍යතා සපුරාලීම සහ බාධාවකින් තොරව එකට වැඩ කිරීම, පූර්ණ හැකියාවන් උපයෝගී කර ගැනීම මෙන්ම නව විශේෂාංග සහ තරඟකාරී විසඳුම් පිළිබඳව යාවත්කාලීනව සිටීම සහතික කිරීම.

2020 වසර තුළ සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්

- පුස්තකාල ස්වයංක්‍රියකරණ පද්ධතිය සම්පූර්ණ කිරීම
- ජාලකරණය සම්පූර්ණ කිරීම - ජාල කේබල් කිරීම
- අනුරාධපුර පළාත් පාසල සඳහා තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය පිහිටුවීම
- ශිෂ්‍ය කළමනාකරණ පද්ධතියෙන් (S.M.S) සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධතියෙන් (L.M.S) 60% ක් සම්පූර්ණ කර ඇත.

6.6 පුස්තකාලය



SLITHM පුස්තකාලය සංචාරක හා ආගන්තුක සත්කාර අංශයේ නියැලී සිටින සිසුන්ට සහ සංචාරක වෘත්තිකයින් සඳහා ප්‍රධාන තොරතුරු මූලාශ්‍රයයි. පාඨමාලා සඳහා සහභාගිවන්නන්ගේ මෙන්ම SLITHM සහ සංචාරක අංශයේ වෘත්තීය කාර්ය මණ්ඩලයේ තොරතුරු සහ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා එය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අංගසම්පූර්ණ පුස්තකාලය පොත් 10,000 කට අධික ප්‍රමාණයක්, සංචාරක වාර්තා 1,000 කට අධික ප්‍රමාණයක් සහ තෝරාගත් වාර සඟරා සමඟ හොඳින් ගබඩා කර ඇත. පුස්තකාලයේ විශේෂ එකතු කිරීම් අතර ලෝක සංචාරක සංවිධානය (WTO) ප්‍රකාශනය, පුහුණු අත්පොත්, සමාගම් වාර්ෂික වාර්තා, වාර සඟරා සහ සංචාරක සම්බන්ධ ලේඛන ඇතුළත් වේ. SLITHM පුස්තකාලය 2020 දී සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලදී. තවද, පුස්තකාල ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ප්‍රමිතිගත සේවාවක් සැපයීම සඳහා ආරම්භ කරන ලදී. ඊට අමතරව පුස්තකාලයේ අතථ්‍ය සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර කොළඹ සහ මහනුවර පුස්තකාල සඳහා පොත් 100 කට වැඩි ප්‍රමාණයක් මිලදී ගෙන ඇත.

6.7 අභ්‍යන්තර විගණන අංශය

2020 වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන වාර්තා 07 ක් සඳහා යම් යම් යෝජනා, නිර්දේශ නිකුත් කර ඇත. අදාළ නිලධාරීන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලය වූයේ පිරිවැය අවම කිරීම සහ වඩා හොඳ අභ්‍යන්තර පරීක්ෂා කිරීම් මගින් ක්‍රියාවලීන් විධිමත් කිරීමයි.

විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව, රාජ්‍ය ව්‍යවසායයේ මෙහෙයුම් සහ ක්‍රියාකාරිත්වයේ මූල්‍ය අංශයන්හි නිසි කාර්යක්ෂමතාවය සහ පාලනය අධීක්ෂණය කිරීමට විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) හට බලය ඇත.

2020 වසර තුළ පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පහත පරිදි වේ.

අංකය	දිනය
31 වැනි	2020 පෙබරවාරි 20
32 වැනි	2020 ජූලි 06
33 වැනි	2020 දෙසැම්බර් 17

6.8 සමුදා පුහුණු පාසල



සමුද්‍රා පුහුණු හෝටලය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය එකම පරිශ්‍රයක පිහිටා ඇත. සමුද්‍රා පුහුණු හෝටලය සහ SLITHM පුහුණු පාසල එකම කළමනාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වේ. න්‍යාය භාවිතය සඳහා සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුවේ මූලික අරමුණු සඳහා සමුද්‍රා පුහුණු හෝටලය ඵලදායී හා කාර්යක්ෂමව භාවිතා කරයි.

පුහුණු හෝටලය පහත අංගවලින් සමන්විත වේ.

- සාධාරණ මිල ගණන් යටතේ ඉහළම මට්ටමේ සුවපහසුව ලබා දෙන කාමර දහයක්, එක් කට්ටලයක් Deluxe කාමර දෙකකින් සහ මුළුතැන්ගෙයකින් සමන්විත වේ.
- මොනාරා අවන්හලට ඕනෑම වේලාවක අමුත්තන් 40 සිට 100 දක්වා ආහාර වේලක් ලබා දිය හැකිය. අවන්හලට යාබදව කොක්ටේල් විවේකාගාරයක් සහ කුඩ බාර් එකක් ඇත.
- 250 ආසන ධාරිතාවයකින් යුත් SLITHM හි තාහීර් ශ්‍රවණාගාරය සමුළු, සම්මේලන, රැස්වීම් යනාදිය පැවැත්වීම සඳහා සියළු පහසුකම් සහිතව සකස් කොට ඇත.
- ශරීර සුවතා මධ්‍යස්ථානය
- ලොන්ඩ්‍රිය

6.9 ලොන්ඩ්‍රි අංශය



වර්තමානයේ ලොන්ඩ්‍රි සහ ඩ්‍රයි ක්ලීනිං (Laundry & Dry Cleaning) ක්‍රියාවලිය ලෝකයේ මහා පරිමාණ කර්මාන්තයක් ලෙස ඉස්මතු වී තිබේ. හෝටල් හා රෝහල් මෙහෙයුම් ඵලදායී ක්‍රියාකාරිත්වයේ මෙම අංශය ඉතා වැදගත් කොටසකි. වෘත්තීය ඩ්‍රයි ක්ලීනිං සහ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු උපකරණ සමඟ ලොන්ඩ්‍රි සහ ඩ්‍රයි ක්ලීනිං මෙහෙයුම් 2013 ජනවාරි මාසයේදී SLITHM කොළඹ දී ආරම්භ කරන ලදී. එය ගාලු පාරට මුහුණලා බිම් මහලේ පහසු ස්ථානයක පිහිටා ඇත. ලොන්ඩ්‍රි සහ ඩ්‍රයි ක්ලීනිං පාඨමාලාව න්‍යාය හා ප්‍රායෝගික යන දෙකම SLITHM සිසුන් සඳහා පවත්වනු ලැබේ. 2018 දී සකස් කරන ලද ව්‍යාපාර සැලැස්ම මත පදනම්ව ආදායම් ඉපැයීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ.

7. මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

වත්කම්	සටහන	2020	2019 ප්‍රතිස්ථාපිත
ජංගම වත්කම්			
මුදල්	03	5,514,431	3,610,729
වෙළඳ ණයගැතියන්	04	25,517,566	26,244,028
